# මන්මුනෙයි - බටහිර ප්‍රාදේශිය සභාව

## මඩකලපුව දිස්ත්‍රික්කය

---------------------------------------------------

1. මූල්‍ය ප්‍රකාශ

------------------

1.1 මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම

--------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ 2014 මාර්තු 27 දින ද, ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ 2013 අප්‍රේල් 08 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 දෙසැම්බර් 04 දින සභාවේ, සභාපතිවරයා වෙත නිකුත් කරන ලදි.

1.2 මතය

--------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශ වලින් 2013 දෙසැම්බර් 31 දිනට මන්මුනෙයි - බටහිර ප්‍රාදේශිය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශ පිළිබඳ අදහස් දැක්වීම්

----------------------------------------

1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල වීම

-------------------------------------------------------

පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශ ලේකම්ගේ 2014 ජනවාරි 27 දිනැති පීඑල්/05/පීඒ/එස්එල්පීඑස්ඒඑස් දරන චක්‍රලේඛය අනුව රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

-------------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණයවිය.

(අ) සමාලෝචික වර්ෂය සඳහා ගෙවියයුතු රු. 16,000 ක විගණන ගාස්තු වෙනුවෙන් ගිණුම්වල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ආ) 1990 වර්ෂයේදි වූ යුදමය වාතාවරණ හේතුවෙන් රු. 185,062 වටිනා ලී බඩු ඉවත්කර තිබුණද, ඒවා ලියාහැරීමට කටයුතු නොකිරීම නිසා ගිණුම් ප්‍රකාශ වල වත්කම්වල වටිනාකම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) 2013 දෙසැම්බර් 31 දිනට ආපසු ලබාගත හැකි තැන්පත් ශේෂය ලෙජරය අනුව රු. 6,954,180 ක් මූල්‍ය ප්‍රකාෂ වල එය රු. 6,254,697 ක් ලෙස දක්වා තිබීම නිසා රු.699,483 ක වෙනසක් නිරික්ෂණය විය.

(ඈ) සමාලෝචිත වර්ෂයේදී පළාත් සභා අමාත්‍යාංශයෙන් ආසියානු සංවර්ධන බැංකු ණය ක්‍රමය යටතේ ලැබී තිබූ රෝද දෙකේ ට්‍රක්ටර් යන්ත්‍රයේ වටිනාකම ගණනය කර ගිණුම්වලට ගෙන නොතිබුණි.

1.3.3 ගෙවිය යුතු ගිණුම්

--------------------

වර්ෂ 1990 – 2010 දක්වාවූ කාල පරිච්ඡෙදයේ විවිධ කාරණා සඳහා ලබා ගත් අත්තිකාරම් මුදල් වන රු. 1,873,377 ක මුදල නිරවුල් කිරීම සඳහා කටයුතු කර නොතිබුණි.

1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

------------------------------------

මූල්‍ය ප්‍රකාශ වල දක්වා තිබූ පහත දැක්වෙන විෂයයන් ඉදිරියේ පෙන්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| විෂයයන් | වටිනාකම<br>රු | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|
| ඉඩම් | 17,254,585 | හිමිකම් ඔප්පු |
| යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 1,299,297 | ස්ථාවර වත්කම් ලේඛන, වත්කම් පිළිබද විස්තාරාත්මත උපලේඛන සහ සමීක්ෂණ මණ්ඩල වාර්තා |
| ලී බඩු සහ සවිකිරීම් | 768,188 | |
| මෝටර් වාහන සහ කරත්ත | 145,425 | |
| පුස්තකාල පොත් | 930,723 | |
| ණය හිමියෝ | 1,873,377 | විස්තරාත්මක ණයහිමි ලේඛය |

1.3.5 නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම

-----------------------------------------------------

පහත සඳහන් අනුකූල නොවූ අවස්ථා විගණනයේදී නිරීක්ෂණ විය.

| නීති, රීති යනාදියට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) ප්‍රාදේශිය සභා (මූල්‍ය හා පරිපාලන ) රීති - 1988 | |
| (i) 1පරිච්ඡේදයේ 5 (XII) වගන්තිය | මුදල්, ගබඩා ද්‍රව්‍ය සහ චෙක්පත්වලට අත්සන් තැබීම යනාදී කටයුතු නිලධාරින් හතර දෙනෙකුට ක්‍රමානුකූලව භාරදී තිබුණද ඔවුන්ගෙන් ආරක්ෂක ඇප ලබා ගෙන නොතිබුණි. |
| (ii) III පරිච්ඡේදයේ 81 වගන්තිය | ඉඩම් වල අයිතිය පැවරීම සම්බන්ධව මුද්දර බදු ප්‍රතිපූර්ණ කිරීමේ අයදුම්පත් රෙජිස්ටාර් ජනරාල් වෙතද අනෙකුත් ගනුදෙනු සම්බන්ධ බදු ප්‍රතිපූර්ණය කිරීම සඳහාවූ අයදුම්පත් මහාභාණ්ඩාගාරයේ අධ්‍යක්ෂකවරයාටද දඩමුදල් ප්‍රතිපූර්ණ කිරීම සඳහාවූ අයදුම්පත් උසාවිවල ලේඛකාධිකාරි වෙතද එක් එක් කාර්තු අවසානයෙදීද ඉදිරිපත් කර නොතිබුණි. |
| (iii) X පරිච්ඡේදයේ 191 වගන්තිය | සමාලෝචිත වර්ෂයේ මහා සභා රැස්වීම් දොලහක් පවත්වා තිබූ නමුදු, එම රැස්වීම් වාර්තාවල සහතික කළ පිටපත් විගණනයට ඉදිරිපත්කර නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය

-----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵලය

-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශ අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු. 4,652,788 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු.4,468,002 ක් විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.184,786 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

2.2 ආදායම් කළමනාකරණය

----------------------------

2.2.1 ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය

----------------------------------------

සභාව විසින් ඉදිරිපත් කර තිබූ සමාලෝචිත වර්ෂයයේ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් අතර සැළකිය යුතු විචලනයන් නිරීක්ෂණය විය.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | විචලනය |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| බදු | 1,821,000 | 1,364,245 | (465,755) |
| සෙවා ගාස්තු | 852,500 | 496,376 | (356,124) |
| දඩ මුදල් | 906,000 | 2,610,105 | 1,704,106 |
| වෙනත් ආදායම් | 1,265,000 | 1,959,265 | 694,265 |
| රාජ්‍ය බදු ආදායම් | 9,690,000 | 8,295,153 | (1,394,847) |

2.2.2 වරිපනම් හා බදු

-----------------

1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 134 වගන්තිය අනුව ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ තිබෙන ඉඩම් සහ ඉදිකරන ලද නිවාස සහ ගොඩනැගිලි සඳහා වරිපනම් බදු අයකර ගැනීම සඳහා තක්සේරු දෙපාර්තමෙන්තුවෙන් වාර්ෂික වටිනාකම තක්සේරු කරවා ගැනීම සඳහා කටයුතු නොකිරීම නිසා දල වශයෙන් රු. 500,000 වාර්ෂික ආදායමක් අහිමිවී තිබුණි.

3 ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

----------------------------------------

3.1 අයවැය පාලනය

------------------

අයවැයගත වියදම් සහ තථ්‍ය වියදම් අතර 53 % සිට 75 % දක්වා විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛණය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් වශයෙන් යොදාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

4 පද්ධති හා පාලන

--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අයවැය පාලනය

(ඇ) ආදායම් රැස්කිරීම

(ඈ) ආදායම් කළමනාකරණය

(ඉ) ස්ථාවර වත්කම් පාලනය

(ඊ) සේවක ණය අයකිරීම